රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 327 (ii)

(27)

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1986 ජූනි මස 24 වැනිදින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත,

1986 නව වැටුප් - වැටුප් පරිමාණයන්හි උපරිමයේ රැඳීසිටීමේ සීමාවන් ඉවත් කිරීම - 1986.06.16 දිනැති අංක 327 (i) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට සංශෝධන

---

1986.06.16 දිනැති අංක 327 (i) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පහත දැක්වෙන පරිදි සංශෝධනය කෙරේ.

1. 1 වැනි ඡේදය ඉවත්කර මෙය ආදේශ කරන්න.

   "මෙම ඡේදය යටතේ වැටුප් පරිවර්තනය කිරීමෙන් අනතුරුව 1985.12.31 දිනට සේවයේ යෙදී සිටි සියළුම නිලධාරීන්ට, 1986.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 1986 නව වැටුප් මත තවත් එක් වැටුප් වර්ධකයක් දිය යුතුය. එසේ වුවද, අංක 327 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි 5 (ii) වැනි ඡේදය යටතේ රැඳී සිටීමේ වාසියට හිමිකම් ඇති නිලධාරීන්ට, මෙම වැටුප් වර්ධකය නොදිය යුතුය."

2. 3 වැනි ඡේදය ඉවත් කර මෙය ආදේශ කරන්න.

   "1986 නව වැටුප්වලට පරිවර්තනය කිරීමෙන් අනතුරුව, නිලධාරියෙකුගේ වැටුප් වර්ධකයක වටිනාකම පෙරට වඩා අඩුනම්, එබඳු නිලධාරියෙකුට එකී වෙනස, පාඩුව මැකී යන තෙක් ගෙවිය යුතුය. 1986 නව වැටුප්වල වැටුප් වර්ධකයක වටිනාකමට වඩා වැඩි වැටුප් වර්ධක වටිනාකමක් අනාගත දිනයකදී හිමි නිලධාරියකුටද මෙය අදාල විය යුතුය."

Siriwardhana

ඩී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සු/-